## බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## වර්ෂ අවසාන ඇගයීම - 2001

**07 ශ්‍රේණිය** **ගණිතය**

නම : ........................................................................................................ කාලය පැය : 2

**1 කොටස**

- උපදෙස්:- ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.

1. හිස් තැන් පුරවන්න. (ඔත්තේ, ඉරට්ටේ යන වචන දෙක පමණක් භාවිත කරන්න.)



(1) කූඩු දෙකෙහිම සිටින මුළු කුකුළු පැටවුන් සංඛ්‍යාව ..................... සංඛ්‍යාවකි.

(2) කූඩු දෙකෙහිම සිටින කුකුළු පැටවුන් සංඛ්‍යාවේ වෙනස ................... සංඛ්‍යාවකි.

2. පහත දැක්වෙන සංඛ්‍යාව සම්මත ආකාරයට ඉලක්කමෙන් ලියන්න.

10000575250 ..................................................

3. රූපයේ හිස් රවුම තුළට ගැලපෙන ඉලක්කම ලියා 12 ප්‍රථමක සාධකවල ගුණිතයක් ලෙස ලියන්න.




12 = ..............................

4. 1231, 1324, 1235 සංඛ්‍යා අතරින් ඉතිරි නැතිව 4 න් බෙදෙන සංඛ්‍යාව රවුම් කරන්න. පිළිතුර තෝරා ගැනීමට හේතු දක්වන්න.

........................................................................

5. මෙම පතරොම භාවිතයෙන් සාදාගත හැකි ඝනවස්තුව නම් කරන්න.



........................................................................

6. 


ඉහත රූපය ඇසුරු කරගෙන හිස්තැනට අදාල සංඛ්‍යාව ලියන්න.

| | | | |
|---|---|---|---|
| | පාසලේ සිට තැපැල් හලට දුර | = | 350 m |
| (i) | තැපැල් හලේ සිට නිවසට දුර | = | _______km _______m |
| (ii) | පාසලේ සිට නිවසට මුළු දුර | = | _______km _______m |

7. 


රූපයේ පරිමිතිය සඳහා ප්‍රකාශනයක් ලියන්න.

..................................................

8. 3 kg 352 g × 5 ..................................................

9. $2\frac{1}{3} \times 6$

$= \frac{\square}{3} \times 6$

$= \square$

10. 0.026 × 8 සඳහා පහත සඳහන් පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

208, 0.208, 20.8

11. 


රූප සටහනට අනුව සුළු කෝණයක් සහ මහා කෝණයක් නම් කරන්න.

(1) සුළු කෝණය ................................

(2) මහා කෝණය ................................

12. පහත දී ඇති සංඛ්‍යා ආරෝහණ පිළිවෙලට ලියන්න.

-2, -3, 0, 4, 1 ................................................................................

13. රූප සටහනේ දැක්වෙන්නේ යකඩ කූරු වැටකි. AB හා CD කම්බි කූරු දෙක අතර පරතරය වෙනස් නොවේ.එබැවින් AB, CD ............රේඛාවේ මෙය දැක්වෙන සංකේතයරූප සටහනේ දක්වන්න.




14. ගුණිත ලෙස විහිදුවා ලියන්න. $3^2 x^2 y$

To download past papers visit www.vajirapani.blogspot.com

15. ත්‍රිකෝණ පාද අනුව වර්ග කර හිස්තැන ලියන්න.




(i) ..................




(ii) .........................




(iii) ......................

16. 


මෙම වෘත්තයේ AB විෂ්කම්භයක් වේ.

(1) කේන්ද්‍රය නම්කරන්න. ....................................

(2) අරයක් නම් කරන්න. ....................................

17. 450 : 15 සරලම ආකාරයෙන් දක්වන්න...............................

18. සංඛ්‍යා රේඛාව මත $x = 2$ හා $x = -3$ දක්වන්න.




19. “ම හ ර ග ම ” යන වචනයේ අකුරු කුලකය වෙන් රූපයක දක්වන්න.

20. ක්‍රි:ව: 2000 අධික අවුරුද්දකි. ඊළඟට අධික අවුරුද්දක් වන්නේ කුමන වර්ෂයද?

.....................................................................

## 2 කොටස

**උපදෙස් :- සපයා ඇති ප්‍රශ්න 8 න් කැමති ප්‍රශ්න 6 ක් තෝරා පිළිතුරු සපයන්න.**

(ලකුණු 10 x 6 = 60)

1. (1) 65364 සංඛ්‍යාවේ ඉලක්කම් දර්ශකය කීයද?
   (2) 65364 සංඛ්‍යාව ඉතිරි නැතිව 3 න් සහ 4 න් බෙදීමට හැකිය. එයට හේතුව දක්වන්න.
   (3) පහත දැක්වෙන සංඛ්‍යා අතරින් 5 න් බෙදෙන සංඛ්‍යා තෝරා ලියන්න.
   59, 70, 81, 85, 95, 102, 810
   (4) $36 = 2 \times 2 \times 3 \times 3$
   $45 = 3 \times 3 \times 5$
   $60 = 2 \times 2 \times 3 \times 5$
   ඉහත සාධක උපකාර කර ගැනීමෙන් 36, 45, 60 යන සංඛ්‍යාවල මහා පොදු සාධකය හා කුඩා පොදු ගුණාකාරය සොයන්න.

2. (1) "$x$ නම් සංඛ්‍යාව 4 න් ගුණකර 5 ක් එකතුකරන්න." ඉහත කියමන සඳහා පොදු ප්‍රකාශනයක් ගොඩ නගන්න.
   (2) පහත දැක්වෙන ප්‍රකාශනය වචනයෙන් ලියා දක්වන්න.
   $$\frac{2P}{4} - 5$$
   (3) $5a + 3 + 2a + b$ මෙය පද හතරක වීජීය ප්‍රකාශනයකි.
   (අ) මෙහි සජාතීය පද තෝරා ලියන්න.
   (ආ) මෙහි $a$ යන පදවල $a$ හි සංගුණක ලියා දක්වන්න.
   (ඇ) $b$ යන පදයේ $b$ හි සංගුණකය කුමක්ද?
   (ඉ) $5a + 3 + 2a + b$ ප්‍රකාශනය පද තුනක ප්‍රකාශනයක් ලෙස ලියන්න.
   (ඊ) $3x + 2(x + y)$ සුළුකර දක්වන්න.

3. (1) මෙම ඝනකයේ ශීර්ෂ කීයද? දාර කීයද?



To download past papers visit
www.vajirapani.blogspot.com

   (2) ඉහත ඝනකය ඒකකයක් ලෙස සලකමින් දිග පැත්තට ඝනක 4 ක් ද පළල පැත්තට ඝනක 3 ක් වනසේ තනි තට්ටුවක් පිළියෙල කරන්න. (රූප සටහන අඳින්න.)
   (3) එම රූපයේ දැක්වෙන පරිමාව ඒකක කීයද?
   (4) මෙම ඝනකාභයෙහි අඳුරු කර ඇති මුහුණතෙහි,




   (1) දිග කීයද?
   (2) පළල කොපමණද?
   (3) මෙම මුහුණතෙහි වර්ග ඵලය සොයන්න.

4. ඔබේ ගණිත උපකරණ කට්ටලය භාවිතයෙන් පහත දැක්වෙන මිනුම් නිවැරදිව ඇඳ දක්වන්න.
   (1) 6cm දිග AB සරල රේඛා ඛණ්ඩය අඳින්න.
   (2) A ශීර්ෂයෙන් $60^\circ$ ක කෝණයක් නිර්මාණය වන්සේ AP රේඛාව අඳින්න.
   (3) AP රේඛාව මත 4 cm දුරින් වූ C නම් ලක්ෂ්‍යය ලකුණු කරන්න.
   (4) C හරහා AB ට සමාන්තර රේඛාව අඳින්න. (විහිත චතුරස්‍රය හා අඩිකෝදුව භාවිතයෙන්)
   (5) සමාන්තර රේඛාව මත CD=6cm වනසේ D ලක්ෂ්‍යය ලකුණු කර DB යා කරන්න.
   (6) CDB කෝණයේ අගය මැන ලියන්න.
   (7) ABDC රූපයේ පරිමිතිය සොයන්න.

5. පෘථිවියේ සිට බුද ග්‍රහයාට ඇති දුර කිලෝමීටර් 56, 838, 793, 534 කි.

(1) මෙම සංඛ්‍යාව බිලියන, මිලියන, දහස්, ඒකක කලාප වලට වෙන්කර ලියන්න.

(2) මෙම සංඛ්‍යාව කියවන ආකාරය ලියන්න.

(3) 5101020209 මෙය සම්මත ආකාරයට ලියා දක්වන්න.

(4) දස බිලියන පන්සිය හැටපන් දහස් තුන ඉලක්කමෙන් ලියන්න.

6. දෙහි ගෙඩි කිලෝග්‍රෑමයකට අල්ලන දෙහි සංඛ්‍යාව පිළිබඳව සොයා ලැබූ ගිහාන් ඔහු ලබාගත් දත්ත වෘන්ත පත්‍ර සටහනක මෙසේ දැක්විය.

| වෘන්ත | පත්‍ර |
|---|---|
| 1 | 0, 1, 2, 2, 8 |
| 2 | 2, 3, 4, 5 |
| 3 | 0 |

(1) මෙම වෘන්ත පත්‍රයට අනුව එක් එක් කිලෝග්‍රෑමය සඳහා ගිහාන් ලැබූ දෙහි ගෙඩි සංඛ්‍යාව ලියා දක්වන්න.

(2) එහි වූ අඩුම ගෙඩි සංඛ්‍යාව (අවම ගණන) වැඩිම ගෙඩි සංඛ්‍යාව (උපරිම ගණන) සඳහන් කරන්න.

(3) එක සමාන ගෙඩි සංඛ්‍යාවක් කිහිප වතාවක් ලැබී ඇත. එම සංඛ්‍යාව කීයද?

(4) ගිහාන් සොයා බැලීමට ගත් දෙහි ගෙඩි මුළු සංඛ්‍යාව කීයද?

7. පහත දැක්වෙන කුලකවල අවයව ලියා දක්වන්න.

(1) (a) {දිග මැනීමේ අන්තර්ජාතික මිනුම් ඒකක}

(b) {ඔබ ඉගෙනගත් ඝණ වස්තු කුලකය}

(2) 1, 2, 3, 4, 5, 6 යනුවෙන් අංක සටහන් කරනලද ඝනකාකාර දාදු කැටයක් උඩ දැමූ විට

(a) 5 සටහන් කළ පැත්ත වැටීමේ සම්භාවිතාව කීයද?

(b) ඔත්තේ සංඛ්‍යාවක් සටහන් කල පැත්ත වැටීමේ සම්භාවිතාව කීයද?

To download past papers visit www.vajirapani.blogspot.com

8.




මෙම ඛණ්ඩාංක තලය පිටපත් කරගෙන

(1) A ලක්ෂ්‍යයේ ඛණ්ඩාංක ලියන්න.

(2) B=(5,3) නම් B ලක්ෂ්‍යය ලකුණු කරන්න.

(3) A ලක්ෂ්‍යයේ සිට ඒකක 2 ක් ඉහළින් පිහිටි C ලක්ෂ්‍යය ලකුණු කරන්න.

(4) ABC යාකර ලැබෙන රූපය කුමන නමකින් හැඳින්වේද?

(5) මෙම රූප සටහනෙහි y අක්ෂය පරාවර්තන රේඛාව ලෙස ගෙන ABC රූපයේ පරිවර්තන ප්‍රතිබිම්භය ඇඳ දක්වන්න.